# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1838/11 - 2013 නොවැම්බර් මස 26 වැනි අඟහරුවාදා - 2013.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1992 අංක 01 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ (සංශෝධන) ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සහ 7 (1) - (2) සහ 1993 අංක 03 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තියේ 5 - 6 වන වගන්තිය යටතේ වූ රීති

1992 අංක 01 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ (සංශෝධන) ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සහ 7 (1) - (2) සහ 1993, අංක 03 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තියේ 5 - 6 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාත තුළ මගී ප්‍රවාහනයේ යොදවනු ලබන පෞද්ගලික බස්රථ වල ගමන් ගන්නා මගීන් හට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා සාදනු ලැබ ඇත්තාවූ රීති පහත සඳහන් පරිදි බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,
සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම හා බෙදා හැරීම් සහ
ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

වර්ෂ 2013 නොවැම්බර් මස 01 වැනි දින දී ය.

මෙම "රීති බස්නාහිර පළාතේ ධාවනය කරනු ලබන පෞද්ගලික බස්රථ ධාවනය විධිමත් කිරීම සඳහා නවීන තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් හඳුන්වනු ලබන පහත සඳහන් රීති 2013 නොවැම්බර් මස 01 වැනි දින සිට බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන්නේය.

1A - PG 001849 — 160 (2013/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රෙගුලාසි පැනවීම**

* මගීනට පෙරගෙවුම් කාඩ්පත් භාවිතා කළ හැකි අධිකාරියේ අනුමැතිය ලත් විද්‍යුත් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍ර බස්රථවල භාවිතා කිරීමට පහසුකම් සපයා තිබිය යුතුය.

* වඩා කාර්යක්ෂමභාවය බස් ධාවන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන නවීන තාක්ෂණය ආදේශ කර ගැනීමට හැකිවන පරිදි අධිකාරියේ අවසර ලත් G P S තාක්ෂණ උපකරණ බස්රථයේ සවිකර තිබිය යුතුය.

* අධිකාරිය අනුමත කරන සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයකට බස්රථයේ රියදුරු කොන්දොස්තර මහත්වරු (සේවක කණ්ඩායම්) ඇතුළත් විය යුතුය.

12 - 433

---

# නිවැරදි කිරීමයි

**සබරගමුව පළාතේ පළාත් සභාව**

1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය

**77 (1) අ සහ 40 (2) වගන්තිය යටතේ නියෝගය**

අංක 1835/10 සහ 2013 නොවැම්බර් මස 05 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ,* සබරගමුව පළාතේ පළාත් සභාවේ, ඉහත සඳහන් දැන්වීමට අදාළව පළ කරන ලද 685/2 දරන දැන්වීමේ නියෝගයේ සහ ආකෘති පත්‍රයේ "අංක බීසී/එස්.ඒ.බී/එස්.ඩී./පීඑස් - 01 නො. 00001'' ලෙස වැරදියට මුද්‍රණය වී ඇති අතර, එය "අංක. පීබී/එස්.ඒ.බී./එස්.ඩී/පී.එස් - 01 - නො. 00001'' ලෙස නිවැරදි විය යුතුය.

මහීපාල හේරත්,
ප්‍රධාන අමාත්‍ය,
සබරගමුව පළාත.

12 - 396

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.